**60 | S | I,II**

**ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය**
**Business & Accounting Studies**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) තරග විභාගය 2012 ජුලි
2012
Genaral Certificate of Education (Ord. Level) Examination, July 2012

**ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය I , II**
**வணிகக் கல்வியும் கணக்கீடும் I , II**
**Business and Accounting Studies I , II**

පැය තුනයි
*Three hours*

10 ශ්‍රේණිය
*Grade 10*

## ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය I

සැලකිය යුතුය :
(i) **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
(ii) **1** සිට **40** තෙක් ප්‍රශ්න වල දී ඇති (1), (2), (3), (4) පිළිතුරු වලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන** හෝ පිළිතුර තෝරා ගන්න.
(iii) **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරා ගත් පිළිතුරට අදාල අංකය හා සැසඳෙන කවය මත (x) ලකුණ යොදන්න.**

---

01. පහත දෑ අතරින් අවශ්‍යතාවයක් නොවනු යේ,
1. ආහාර 2. ඇඳුම් 3. පොත්පත් 4. ආරක්ෂාව

02. අවශ්‍යතා යනුවෙන් හඳුන්වන්නේ,
1. ව්‍යාපාර විසින් නිර්මාණය කරන්නා වූ දෑය.
2. මූලික තෘප්තීන් ඉටුකර ගැනීමට මිනිසා තුළ වන පෙළඹවීමේ ස්වභාවයයි.
3. වුවමනාවන් ඉටුකර ගැනීමට මිනිසා තුළ ඇති කැමැත්තයි.
4. වුවමනා සපුරා ගැනීමට යොදා ගන්නා විවිධ ස්වරූපයි.

03. අවශ්‍යතාවක් හා වුවමනාවක් අනුපිළිවෙලින් දැක්වෙන යුගලය තෝරන්න. த் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை
1. වෛද්‍යවරු - රෝහල් 2. ඇඳුම් - නිවාස
3. සෞඛ්‍යය - ආරක්ෂාව 4. අධ්‍යාපනය - පොත්පත්

04. පහත සඳහන් කර්මාන්ත අතුරින් ප්‍රාථමික නිෂ්පාදන කාණ්ඩයට හා කාර්මික නිෂ්පාදන කාණ්ඩයට වැටෙනු යේ,
1. කෘෂි 2. දැව හා වන 3. ධීවර 4. පතල් හා කැණීම්

05. පහත සඳහන් දෑ අතරින් සමාජ හා සංස්කෘතික පරිසරයට අදාල නොවනුයේ,
1. ආහාර පුරුදු වෙනස් වීම 2. අන්තර් ජාතික සබඳතා
3. ආගමික ඇදහිලි 4. මිනිසුන්ගේ සිතුම් පැතුම්

06. ව්‍යාපාර බිහිවීම සඳහා මූලික වූයේ,
1. පුද්ගල විශේෂීකරණය 2. භාණ්ඩ හුවමාරුව
3. මුදල් භාවිතය 4. කාර්මික විප්ලවය

07. පහත උදාහරණ අතරින් වක්‍ර නිෂ්පාදනයට අයත් වන්නේ,
1. නිවසේ ඉවුම් පිහුම් සඳහා මිරිස් වගා කිරීම.
2. සුමනා විසින් දියණියට ගවුමක් මැසීම.
3. සිරිදාස විසින් තම එළවළු කොටුවෙන් ගත් එළවළු පොළෙහි අළෙවි කිරීම
4. කමල් විසින් තම නිවසේ පරිභෝජනයට කිරි ලබා ගැනීම සඳහා එළදෙනෙක් ඇති කිරීම.

08. පහත දෑ අතරින් ප්‍රාථමික නිෂ්පාදනයට අදාල නොවනුයේ,
1. ගොවිතැන් කිරීම. 2. ධීවර කර්මාන්තය
3. ගොවිපලක් පවත්වාගෙන යාම. 4. වඩු කර්මාන්තය.

09. හොඳ මුදලක ලක්ෂණයකි,
1. පොදු පිළිගැනීමක් නොතිබීම. 2. පහසුවෙන් හඳුනාගත හැකි වීම.
3. දුලභ වීම 4. බාහිර අගය අභ්‍යන්තර අගයට වඩා වැඩි වීම.

*දෙවන පිටුව බලන්න*

10. මේ අතරින් සාවද්‍ය බෙදාහැරීම් මාර්ගය වනුයේ,
1. නිෂ්පාදකයා ⟶ තොග වෙළෙන්දා ⟶ සිල්ලර වෙළෙන්දා ⟶ පාරිභෝගිකයා
2. නිෂ්පාදකයා ⟶ පාරිභෝගිකයා
3. නිෂ්පාදකයා ⟶ තොග වෙළෙන්දා ⟶ නියෝජිතයා ⟶ පාරිභෝගිකයා
4. නිෂ්පාදකයා ⟶ සිල්ලර වෙළෙන්දා ⟶ පාරිභෝගිකයා

11. භාණ්ඩ හුවමාරු ක්‍රමය බිඳවැටීමට හේතුවක් නොවනුයේ,
1. අන්‍යෝන්‍ය වශයෙන් අවශ්‍යතා වල ගැලපීම
2. භාණ්ඩ රැස්කර තබා ගත නොහැකිවීම.
3. පරිවහනයට තිබූ දුෂ්කරතා
4. පහසුවෙන් කොටස් කර ගත නොහැකි වීම.

12. බාහිර පරිසරය අධ්‍යයනය තුළින් හඳුනාගත හැකි තර්ජනයකි,
1. ව්‍යාපාර වලට සුදුසු නීතිරීති
2. කාන්තාවන් රැකියා වල නිරතවීම
3. දේශපාලන අස්ථාවරත්වය
4. ළමා ජනගහනය ඉහළ යාම.

13. ලාභ අරමුණු කර නොගත් පෞද්ගලික අංශයේ ව්‍යාපාරයකි,
1. සංස්ථා 2. සමුපකාර 3. සමාගම් 4. හවුල්

14. කේවල ස්වාමි ව්‍යාපාරයකට සාපේක්ෂව හවුල් ව්‍යාපාරයක ඇති වාසියකි.
1. විවිධ හැකියාවන් සතු පිරිසකගේ සංකලනයකි. 2. ලාභය තනිව භුක්ති විඳිය හැකි වීම.
3. සීමිත වගකීම 4. නෛතික පුද්ගලභාවයක් තිබීම.

15. 2007 අංක 7 දරණ සමාගම් පණත බල නොපානුයේ,
1. සංස්ථාපිත සමාගම් 2. පුණ්‍ය සමිති 3. හවුල් ව්‍යාපාර 4. සමුපකාර

16. සමුපකාර ව්‍යාපාරවල ලක්ෂණයක් නොවේ,
1. ලාභ පරමාර්ථයෙන් කටයුතු කිරීම 2. ප්‍රජාතන්ත්‍රවාදී පාලනයක් තිබීම.
3. අතිරික්තය සාමාජිකයින් අතර බෙදීම 4. සාමාජිකයින්ගේ අභිවෘද්ධිය වෙනුවෙන් කටයුතු කිරීම

17. බේකරි ආයතනයක් ආරම්භයේ දී බලපත්‍ර ලබා ගත යුත්තේ,
1. සෞඛ්‍ය අමාත්‍යාංශය 2. පළාත් පාලන ආයතනය
3. මධ්‍යම පරිසර අධිකාරිය 4. පාරිභෝගික ආරක්ෂණ අධිකාරිය

18. ව්‍යාපාරයක මානව සම්පත් වැදගත් වනුයේ,
1. ඉතා පහසුවෙන් පාලනය කළ හැකි වීම. 2. මානව සම්පත අජීවී සාධකයක් නිසා
3. ප්‍රතික්‍රියා දැක්වීමට ඇති නොහැකියාව 4. පුහුණුව තුළින් සංවර්ධනය කළ හැකි වීම.

19. වෙළෙඳ පොල අධ්‍යයනය මගින් හෙළිදරව් කරගත හැකි කරුණු පමණක් ඇතුලත් වනුයේ,
1. වෙළෙඳ පොල ස්භාවය, මානව සම්පත, නිෂ්පාදන ක්‍රම
2. වෙළෙඳ පොළ ප්‍රමාණය, තරගකරුවන්, පාරිභෝගිකයන්
3. ඉල්ලුම, අවශ්‍ය මුදල් ප්‍රමාණය, වෙළෙඳ පොල කොටස
4. භාණ්ඩයේ ගුණත්වය, අවශ්‍ය යන්ත්‍ර උපකරණ, නිෂ්පාදන ක්‍රම.


20. මුළු පිරිවැයට අන්තර්ගත වනුයේ,
1. සෘජු ද්‍රව්‍ය පිරිවැය, ශ්‍රම පිරිවැය, සෘජු වෙනත් පිරිවැය
2. ප්‍රාථමික පිරිවැය, වක්‍ර ද්‍රව්‍ය පිරිවැය, වක්‍ර ශ්‍රම පිරිවැය
3. ද්‍රව්‍ය පිරිවැය, ශ්‍රම පිරිවැය, පොදුකාර්ය පිරිවැය
4. පොදුකාර්ය පිරිවැය හා සෘජු පිරිවැය

21. වාණිජ බැංකු අනෙකුත් බැංකු වෙනස් කොට දක්වනුයේ,
1. ජංගම ගිණුම් පවත්වාගෙන යාම
2. මුදල් ණයට ලබා දීම
3. දේපළ වෙළඳාම් හා පුළුල් තැන්පතු පවත්වාගෙන යාම
4. ජංගම ගිණුම් හා විදේශ විනිමය ආශ්‍රිත සේවා පවත්වාගෙන යාම.

22. චෙක්පත් රේඛණය යනු,
1. චෙක්පත මුහුණතෙහි සමාන්තර රේඛා දෙකක් ඇඳීම ය.
2. චෙක්පත මුහුණතෙහි ආදායකයාගේ නම ලිවීම ය.
3. දේපල වෙළෙඳාම් හා මුදල් තැන්පතු පවත්වාගෙන යාම.
4. ජංගම ගිණුම් හා විදේශ විනමය ආශ්‍රිත සේවා පවත්වාගෙන යාම.

23. චෙක්පතක් පිටසන් කිරීම මඟින්,
1. එය ජංගම ගිණුමක තැන්පත් කළ යුතුය.
2. චෙක්පතට ඉහල ආරක්ෂාවක් ලැබේ.
3. චෙක්පත පැවරීමක් සිදුවේ.
4. චෙක්පතට ඇති පිලිගැනීම වැඩිවේ.

24. පහත සඳහන් රේඛන අතරින් විශේෂ රේඛණය වන්නේ,




1 2 3 4

25. චෙක්පතක චුම්බක තීරුවේ මුලින් ම දැක්වෙන අංක ඛාණ්ඩයෙන් දැක්වෙන්නේ,
1. ජංගම ගිණුම් අංකය
2. චෙක්පත් අංකය
3. බැංකු අංකය
4. බැංකු ශාඛාවේ අංකය

26. චෙක්පතක *MICR* තීරුව වැදගත් වන්නේ කුමන කාර්යයක් සඳහා දැයි තෝරන්න.
1. චෙක්පත නිවැරදි චෙක්පතක් දැයි හඳුනා ගැනීම සඳහා ය.
2. පිළිවෙලකට චෙක්පත් ලිවීම සඳහා ය.
3. චෙක්පතකට ආරක්ෂාවක් සැපයීම සඳහා ය.
4. චෙක්පත් ස්වයංක්‍රියව නිශ්කාශණය කිරීම සඳහා ය.

27. පිළිගත් පාරිභෝගික අයිතිවාසිකමක් වන්නේ,
1. තොරතුරු දැන ගැනීමේ අයිතියයි.
2. සුඛෝපභෝගි ජීවිතයක් ගත කිරීමේ අයිතියයි.
3. සමාජය ගැන සැලකිලිමත් වීමයි.
4. නීතිය ඉදිරියේ සමානාත්මතාවයයි.

28. නෛතික පුද්ගලභාවයක් සහිත ව්‍යාපාරයක් ලෙස ලියා පදිංචි වූ විට ඇති මූලිකම වාසිය වන්නේ,
1. ව්‍යාපාරයට බදු සහන විශාල ලෙස ලැබීමයි.
2. ව්‍යාපාරය නමින් ගිවිසුම් වලට එළඹීමට හැකිවීමයි.
3. කිසිදු නීතිමය බලපෑමක් එල්ල නොවීම යි.
4. ව්‍යාපාරයට රක්ෂණාවරණ ලබා ගැනීම අනවශ්‍ය වීමයි.

29. ව්‍යාපාර සැලැස්මකට අයත් අලෙවි සැලස්මකට ඇතුලත් වන ප්‍රධාන තොරතුරක් වන්නේ,
1. නිෂ්පාදන පිරිවැය
2. මූල්‍ය සම්පාදන මාර්ග
3. අවශ්‍ය ජංගම වත්කම
4. අපේක්ෂිත ආදායම

30. ව්‍යාපාර ආයතනයක අභ්‍යන්තර පරිසරය හා බාහිර පරිසරය වෙන්කළ සාධකය වන්නේ,
1. තාක්ෂණයේ වේගවත් දියුණුව නිසා ව්‍යාපාරය සීඝ්‍රයෙන් වර්ධනය වීමයි.
2. ගෝලීයකරණයේ බලපෑම ව්‍යාපාර වලට ඇතුලු වීම යි.
3. දේශපාලනික හා සමාජ ගැටලු උත්සන්න වීමයි.
4. ආයතනයට බලපාන සාධක පාලනය කළ හැකි ද නොහැකි ද යන්නයි.

හතරවන පිටුව බලන්න

31. පහත සඳහන් ප්‍රකාශ අතුරින් නිවැරදි ප්‍රකාශය වනුයේ,
   1. ව්‍යාපාරයක් වසරක් තුළ නිදහස් කළ යුතු වගකීම් ජංගම වගකීම් වේ.
   2. ව්‍යාපාරය තුළ වසරක් හෝ ඊට අඩු කාලයක් පවතින වත්කම් ජංගම නොවන වත්කම් වේ.
   3. ව්‍යාපාරයක් වර්ෂයකට වැඩි කාලයක් තුළ නිදහස් කළ යුතු වගකීම් ජංගම වගකීම් වේ.
   4. ව්‍යාපාරයක් තුළ වසරකට වඩා වැඩි කාලයක් පවතිනුයේ ජංගම වත්කම් වේ.

32. පොදුකාර්ය පිරිවැය සම්බන්ධ නිවැරදි ප්‍රකාශය වනුයේ,
   1. පොදුකාර්ය පිරිවැය නිෂ්පාදිතයේ වටිනාකමට අදාල නොවේ.
   2. ප්‍රාථමික පිරිවැයෙහි මූලිකාංගයකි.
   3. වක්‍ර ද්‍රව්‍ය, වක්‍ර ශ්‍රමය වක්‍ර වෙනත් පිරිවැයෙන් සමන්විතය.
   4. පොදුකාර්ය පිරිවැය යනු සියළු සෘජු පිරිවැය යි.

33 පහත තොරතුරු ඇසුරෙන් ඒකකයක නිෂ්පාදන පිරිවැය ගණනය කරන්න.

| | |
|---|---|
| සෘජු ද්‍රව්‍ය | 1,600 |
| සෘජු වෙනත් | 200 |
| සෘජු ශ්‍රමය | 1,200 |
| කම්හල් පොදුකාර්ය | 3,000 |
| නිෂ්පාදනය කළ ඒකක ගණන | 2,000 |

1. රු. 2.80    2. රු. 3.00    3. රු. 4.40    4. ඉහත කිසිවක් නොවේ.

34. තොගයක නිෂ්පාදන පිරිවැය රු. 40,000 කි. ලාභ ආන්තිකය 20% කි. නිෂ්පාදන ඒකක සංඛ්‍යාව 2000කි. එක් භාණ්ඩ ඒකකයක විකුණුම් මිල වනුයේ,
   1. රු. 20    2. රු. 28    3. රු. 40    4. රු. 24

35. ව්‍යාපාරයක සිදුවන ගනුදෙනු මුලින් ම සටහන් කරනුයේ,
   1. උපයෝගි පොත් වලය.    2. ලෙජර් ගිණුම් වලය.
   3. ලෙජරයේ ය.    4. ඉහත කිසිවක් නොවේ.

36. එක්තරා වෙළෙන්දෙක් රු 5,000ට ගත් භාණ්ඩයක් 10% ක් ලාභ තබා විකුණයි නම් එහි විකුණුම් මිල වන්නේ,
   1. රු. 4,500    2. රු. 5,500    3. රු. 4,000    4. රු 6,000

37. පහත සඳහන් ඒවායින් උපයෝගි පොතක් නොවනු යේ,
   1. මුදල් පොත    2. ගැණුම් ගිණුම    3. විකුණුම් ජ'නලය    4. දෛනික ගැනුම් පොත

38. ස්ථාවර වත්කමක් නොවන්නේ,
   1. ණයගැතියෝ    2. ලී බඩු    3. යන්ත්‍ර    4. රථ වාහන

39. පහත A තීරුවේ ව්‍යාපාර ආයතනයක දැකිය විවිධ ගිණුම් කිහිපයක් සහ B තීරුවේ ප්‍රධාන ගිණුම් වර්ග කිහිපයක් පහත දැක්වේ.

| A තීරුව | B තීරුව |
|---|---|
| 1. ණයහිමියෝ | A වත්කම් ගිණුම් |
| 2. යන්ත්‍ර ගිණුම | B ආදායම් ගිණුම් |
| 3. වරිපනම් ගිණුම | C වගකීම් ගිණුම් |
| 4. ලැබූ කොමිස් ගිණුම | D වියදම් ගිණුම් |

A තීරුවේ සඳහන් ගිණුම් B තීරුවේ සඳහන් ගිණුම් වර්ග සමග අනුපිලිවෙලින් ගැලපූ විට ලැබෙන නිවැරදි පිලිතුර කුමක්ද ?
   1. C ,A, B, D    2. C ,A, D, B    3. D, B, A, C    4. D, B, C, A

40. වගකීමක් පමණක් ඇතුලත් කාණ්ඩය තෝරන්න.
   1. කාර්යාල උපකරණ, ණයගැතියෝ, අත ඉතිරි මුදල්
   2. ගෙවිය යුතු විදුලිය, ණයහිමියෝ, බැංකු ණය
   3. යන්ත්‍රසූත්‍ර, ඉඩම් ගොඩනැගිලි, මෝටර් රථ
   4. බැංකු ණය, ණයහිමියෝ, වෙළෙඳ තොගය

සා.පෙළ ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයන දේශක
සිසිර කුමාර